


# මරණයට බිය නොවූ මිනිසෙක්

1965 මහ මැතිවරණයේදී බෙලිඅත්ත ආසනයට තරග කළ ඩී ඒ රාජපක්ෂ මහතා පරාජයට පත් විය. ජය ලැබුවේ එක්සත් ජාතික පක්ෂයේ නීතිඥ ඩී. පී. අතපත්තු මහතා ය. ගමේ නිවසට එන වී ගොවීන් ධීවරයන් ගුරුවරුන් සමග පසුවන පියා බැලීමට නිවාඩු දිනවල මහින්ද පැමිණියේය. පියාට ලැබුණු මන්ත්‍රී දීමනාව දැන් නැත. වෙනත් ආදායමක්ද නැත. එහෙත් අම්මා තාමත් ගෙදරට යන එන අයට කෑම සපයයි. ඇතැම් දිනවල ඇය සිය බත් පත අමුත්තන්ට දී කුසගින්නේ සිටි අවස්ථා ගැන මහින්ද දනියි. තාත්තගේ පෞද්ගලික ලේකම්වරයෙකු වූ පියසේන උබේසිංහ මහතා දිනක් ඒ ගැන මෙසේ කීවේය. ඒක තමයි එතුමිය ගේ කැමැත්ත. දන්දීමට උපන් කෙනෙකු නිසා තමයි එතුමියට දන්දිනා කියන නම කේන්ද්‍රය බලල තියන්න ඇත්තේ. මැතිවරණෙදි තාත්තාට වැඩ කළ බොහෝ ගුරුවරුන්ට දඬුවම් ලැබින දුෂ්කර පළාත්වලට මාරුවීම් ලැබින. කීප දෙනෙකුගේ වැඩ තහනම් කෙරින. තාත්තගේ මුහුණ අඳුරු වලාවකින් වැසී ඇති සැටි මහින්ද දුටුවේ ය. එහෙත් දඬුවම් ලැබූ ගුරුවරු තාත්තා සමඟ කතා කලේ දුකකින් නොවෙයි අපි කරන්නේ දරුවන්ට ඉගැන්වීම. හිරමනේ කොයි ගෙදරට ගියත් කරන්නේ පොල් ගාන එක. ඒ ගැන කණගාටු වෙන්න එපා. අපිට දීපු ඉස්කෝල වලදී අපි හොඳට උගන්වනවා. අම්මලා තාත්තලා දිනාගන්නවා. ඊළඟ චන්දෙදි ඒ පළාත් වල අපි කරන්න ඕන දෑ කරනවා. බෙලිඅත්තට ඇවිත් ඔබතුමාටත් වැඩ කරනවා ඒ ගුරු වරු කීහ.දිනක් තාත්තා අධ්‍යාපන ඇමති ඊරියගොල්ල මහතා සමඟ කළ දුරකතන සාකච්ඡාවක් මහින්දට ඇසින. මට වැඩ කළා කියලා බෙලිඅත්තේ ගුරුවරු පිරිසක් ඈත දුෂ්කර පළාත් වලට දාලා මේ අය ආපසු ගම් පළාත්වලට එවන්න ඇමැතිවරයා පිළිතුරු දුන්නේය.

ගුරුවරු හූ කිව්වා. මට විරුද්ධව පෙළපාලි ගියා. දීපු දඬුවම මදි. ඇමැතිතුමා මම අවුරුදු විස්සක් මන්ත්‍රීකම කරල තියෙනවා නියෝජ්‍යකතානායක වෙලා හිටිය නියෝජ්‍යඇමැතිකම් කළා නමුත් මම කවදාවත් රාජ්‍යබලය යොදා කිසිවෙකුට හිංසා කලේ නැහැ. ඔබ එය හොඳට දන්නව. ඇමැතිවරයා පිළිතුරු දුන්නේ නැත. රිසීවරය තබන හඬ පමණක් ඇසින. පිය උරුමයෙන් තිබූ දේපල ජනතා සේවය සඳහා පූජා කොට දිළිඳු බවට පත් මගේ තාත්තා දිළින්දන් සුවපත් කිරීමක් මිස ආත්මාර්ථකාමය ගැන නොසිතූ මගේ තාත්තා දේශපාලන දඬුවම් ලැබ පීඩාවට පත්ව සිටින හිතවතුන් පිළිබඳව සිහිපත් කරමින් දුක් වෙයි. වෙලාව ඒවි ඒ ගැන හිතන්න එපා, ඒ අය බේරා ගන්න ඔබතුමා කළ හැකි හැමදේම කලානේ , හිත දුකෙන් තියාගන්න එක හොඳ දෙයක් නෙමෙයි, දිනක් තාත්තා බැලීමට පැමිණි මුල්ගිරි රජමහ විහාරාධිපති ඕකන්ද යායේ වංගීස නාහිමියෝ පැවසූහ. එවිට මහින්ද තුළ මහත් කම්පාවක් ඇති කළේය.

හාමුදුරුවනේ මම ගිය සුමානේ ගියා එක ගුරුවරයකුගේ ගෙදරට. ඒ ගුරුවරයා අම්පාර ඉස්කෝලෙකට මාරු කරලා. ගෙදර ඉන්නේ පොඩි පුතයි අම්මයි. පුතා නිදා ගන්න පුරුදු වෙලා තිබුන තාත්තා ලඟ. දැන් ඒ පුතාට තාත්තා නැහැ. ඊරියගොල්ල මැතිතුමා ඒ පුතා තාත්ත ගෙන් වෙන් කළා. නිදාගන්න ගිහින් තාත්තා එන්නේ නැද්ද කියලා අහනවා. අම්මා කියනවා හෙට එනවා කියලා. රෑ අවදි වුණාම තාත්තා කිය කියා කතා කරනවා .උදේට නැගිට්ට ගමන් අහනව තාත්ත එනවා නේද කියලා. කවුරුහරි කඩුල්ල පනිනකොට අන්න තාත්තා කියලා දරුවා මිදුලට දුවනවා. දරුවාගේ ඒ වචන අම්මගේ පපුවට ගහන අකුණු වගේ. මේ කතා අහනකොට දුක් නොවී පුළුවන්ද? මං වෙනුවෙන් ජීවිතේ දෙන්න ආ මිනිස්සු. ඒ ඔය කතා මාත් දන්නවා. ඒත් ඔබතුමා ඒ ගැන හිත හිතා දුකෙන් හිටියා කියලා ඇති පලේ කුමක්ද? දුක් වෙවී ඉන්නකොට හෘදයාබාධ පහ සුවෙන් ඇතිවන බව මා අසා තිබෙනවා. ඒ වතාවේ දී තාත්තා දුන් පිළිතුර මහින්දගේ සිතෙහි ගැඹුරින් කාවැදින. හාමුදුරුවනේ හෘදයාබාධ මරණය ලං කරාවි. මගේ ජීවිතය දෙස ආපසු හැරී බැලූවිට පසු තැවෙන්න දෙයක් මට සිහිවන්නේ නෑ. ඒ නිසාම මම මරණයට බය නෑ. හෘදයාබාධ එනවනං ඔහේ ආපු දෙන්.

**දෙනගම සිරිවර්ධන මහතා රචිත දුප්පත් දරුවන්ගේ මිතුරා, මහින්ද රාජ පක්ෂ ජනාධිපතිතුමාගේ ළමා කාලයේ කතා නැමැති කෘතියෙන් උපුටා ගන්නා ලදී.**